**මධ්‍යම පරිසර අධිකාරිය - 2019**

**-----------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

මධ්‍යම පරිසර අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ''මනාලෙස සැලසුම් කරන ලද'' අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් අධිකාරිය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 25 වන ඡේදය පරිදි යම් වත්කමක් අත්පත් කරගෙන ඇති විට අත්පත් කර ගත් දිනයට පවතින සාධාරණ වටිනාකමට ගිණුම්ගත කලයුතු වුවද අමාත්‍යාංශය විසින් අධිකාරිය වෙත ලබාදී තිබූ දේපල පිරියත උපකරණ අයිතම 20 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් වල සාධාරණ අගය ගිණුම්ගත කිරිමට පියවර ගනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 ට අනුව මුදල් ප්‍රවාහයන් පිළියෙල කිරිමේදී මුදලින් සිදුවන ගණුදෙනු ගිණුම්ගත කිරිම සිදුකල යුතු වුවද මුදලින් සිදුනොවුණු රු.4,720,384 ක් ආයෝජන ක්‍රියාකරකම් යටතේ මුදල් ගලායැම් ලෙස දක්වා තිබුණි. | 2020 වසරේ මෙය නිවැරදි කිරමට කටයුතු කර ඇත. | - | එම- |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 ට අනුව ප්‍රමාණාත්මක පූර්ව කාල පරිච්ඡේද වැරදි ඒවා සොයා ගැනීමෙන් පසුව නිකුත් කිරිම සඳහා අනුමත කරන මූල්‍ය ප්‍රකාශන වල අතීතානුයෝගීව ගලපා සංසන්දනාත්මක අගයන් ප්‍රතිෂ්ඨාපනය කර. එම වැරදි වල ස්වාභවය හා ගලපන ලද ආකාරය පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කල යුතු වුවද ඉකුත් වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂයේදී සිදුකර තිබුණු රු. 76,976,507 ක වැරදි නිවැරදි කිරිම පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි. ඒසේම ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වැරදි නිවැරදි කිරිම කර නැවත ප්‍රතිෂඨාපනය කර තිබියදී ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි. . | අතපසුවීමකින් අදාල ගණනයන් 2019 වර්ෂය තුල ලැබීම් ලෙස පෙන්වා ඇති බව. | - | එම- . |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2012 හා 2016 වර්ෂවලදී අධිකාරිය වෙත පවරන ලද මුළු වටිනාකම රු.මිලියන 3.5 ක් වූ වාහන 02 ක් පෙර වර්ෂවලට අදාල ගැලපීම් සිදුනොකර ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | මේ සම්බන්ධයෙන් ගැසට් නිවේදනය ප්‍රකාශ කර ඇත. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මගින් පරිසර වායු දූෂණය පරීක්ෂා කිරිම සඳහා අධිකාරියට ලබා දී තිබුණු වටිනාකම රු.4,642,740 ක් වත්කමක් ලෙස දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු අමාත්‍යාංශ වෙත යොමු කරන ලදි. | ජංගම වත්කම් ස්වරූපයේ ගණුදෙනු බැවින් ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | හිඟ ගොඩනැගිලි කුලී වශයෙන් අධිකාරිය ගෙවීමට ඇති රු. 11,790,000 ක වගකීම් වෙනුවෙන් ප්‍රතිපාදනයන් සිදු කර මුල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | පාර්ලිමේන්තු යොජනා සම්මත කර ගැනිම මඟින් මෙම ගැටළුව විසඳා ගැනිමට ගරු නීතිපතිතුමා විසින් උපදෙස් ලබා දී ඇත. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | 2019 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අපහරණය කලයුතු භාණ්ඩ හා වත්කම් නියමිත පරිදි අපහරණය කලයුතු වුවද අධිකාරියේ රථගාල පරිශ්‍රයේ ගොඩගසා ඇති අපහරණ කළ යුතු භාණ්ඩ සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | වහාම අපහරණය කටයුතු අවසන් කිරිමට නියමිතය. | චක්‍රලේඛ විධි විදාන වලට අනුව කටයුතු කල යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| | | අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් කිරීම. | | |
| (ආ) | 2019 ජුනි 19 දිනැති අංක 04/2019 දරන ජාතික අයවැය චක්‍රලේඛය | ගිවිසුම්ගත සේවාවන් සම්බන්ධයෙන් විධිමත් වියදම් පාලන ක්‍රම යොදා ගැනිමෙන් හා සේවා උපයෝජනය කිරිම පිළිබඳ පසුවිපරම් කිරිමෙන් වියදම් පාලනය කිරිම සඳහා ඉඩ සලසා ගත යුතු වුවද කුලී වාහන ලබා ගැනිම සම්බන්ධයෙන් අධිකාරියේ අවධානය යොමු වී නොතිබුණි. | කුලී ප්‍රවාහන පහසුම් ලබා ගැනිම සඳහා නැවත ටෙන්ඩර් පත් කැඳවීම සිදු කල යුතුව ඇත. | - එම- . |
| (ඇ) | 1997 පෙබරවාරි 03 දිනැති අංක 06/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 ඡේදය | වැඩ බලන කාලය මාස 03 ක උපරිමයකට යටත් විය යුතු බවත් එම කාලය තුලදී අදාල පුරප්පාඩු නොපුරවන ලද්දේනම් එම තනතුර තවදුරටත් ලබා ගැනිමේ අවශ්‍යතාවය අදාල අමාත්‍යංශ ලේකම්වරයා විසින් විමසා බැලිය යුතු බව දක්වා තිබියදී ඉන් බැහැරව අධිකාරිය විසින් දිගින් දිගමට වැඩ බැලීම සඳහා නිලධාරින් පත්කර තිබුණි. | මේ වන විට බඳවා ගැනිම් සිදු කිරිම් සඳහා සිදු කල යුතු කටයුතු වල අවශ්‍ය අදියරේ සිටි. | - එම- |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 102 හා 105 | ජංගම වායු තත්ත්ව රසායනාගාරය අනතුරකට ලක්වී තිබුණද මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම රථය එලදායිව යොදා ගන්නේද යන්න පිළිබඳ විමර්ශනයක් සිදු කරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඉ) | 1988 අංක 56 දරන ජාතික පාරිසරික පනත මගින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත | i. කසළ, පිළිසකර නොකළ මල හා විෂ රසායනික ද්‍රව්‍ය බැහැර කිරීම වැලැක්වීම | පරිසර බලපත්‍ර මාර්ගයෙන් නියාමනය කරන බව | පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| ii. අපද්‍රව්‍ය කළමනාකරණ තුළින් ඇතිවන අතුරු ඵලයක් වන කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය තුළින් රසායනික පොහොර භාවිතය අවම කිරීම පිළිබඳව ප්‍රමුඛතාවය ලබාදීම. | සියලුම ආයතන පලන ආයතන වෙත මූල්‍ය සහ තාක්ෂණික උපදෙස් ලබා දී ඇති බව. | - | එම- |
| iii. නාගරික කසල කළමනාකරණ වැඩසටහන් ක්‍රියාවට නැංවීම හා නියාමනය. | විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කරන බව | - | එම- |
| iv. පොදු ප්‍රවාහන පද්ධතීන් ක්‍රියාත්මක කිරීමේදී ඇති පාරිසරික බලපෑම් නියාමනය කිරීම. | මේ සම්බන්ධයෙන් ගැසට් නිවේදනය ප්‍රකාශකර ඇත. | - | එම- |
| v. පසු භාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. | මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කරන ලදි. | - | එම- |
| vi. ශ්‍රී ලංකාව තුල පවතින පාරිසරික තත්ත්වය පිළිබඳ අධ්‍යයනය කිරිම හා පසුවිපරම් කිරිම හා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය නීති සම්පාදනය කිරිම, ජාතික පාරිසරික ප්‍රතිපත්තිය හා උපමානයන් පිළිබඳ ආරක්ෂා කිරිම හා කළමනාකරණය කිරීමෙහිලා ක්‍රමසම්පාදන හා වෙනත් යම් සාධක පිළිබඳව නිර්දේශ කිරිම, පාරිසරික ආරක්ෂාව සම්බන්ධයෙන් අධිකාරියට බලපත්‍ර | පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර ගැනිම මඟින් මෙම ගැටළුව විසඳා ගැනිමට ගරු නීතිපතිතුමා වෙත උපදෙස් ලබා දී ඇති බව. | - | එම- |

නිකුත් කිරිම යන කාර්යයන් වයඹ පළාත තුල ක්‍රියාත්මක කිරිම.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.71,973,628 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 44,508,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.116,517,271 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට විලම්භිත ආදායම රු. 24,947,737 කින් අඩු වීම හා ගමන් වියදම රු.20,214,529 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෛනිකව දිරන කසල කොම්පොස්ට්කරණය සඳහා රු. 87,492,401 ක් වැය කර ඉදිකර තිබුණු පෙතියාකන්ද කොම්පොස්ට් අංගනය වසර 02 ක කාලයක් ගත වී තිබුණද මේ දක්වාම භාවිතයට ගෙන නොතිබුණි. | සියළු අවශ්‍යතා සම්පූර්ණ කිරිමෙන් අනතුරුව ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරිමට තීරණය කර ඇත. | කඩිනමින් භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කල යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේදී ආරම්භ කර තිබුණු ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීමේ කටයුතු මේ දක්වාම අවසන් වී නොතිබුණි. | අවශ්‍ය ඉදිරි කටයුතු කිරීමට නියමිත බව | පනත සම්මත කර ගැනීමට කඩිනම් කල යුතුය. |
| (ආ) | මධ්‍යම පළාත් කාර්යාලයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර දත්ත පද්ධතිය නිසිලෙස හා කාලීනව යාවත්කාලීන කර නොතිබුණි. | අවශ්‍ය උපදෙස් ලබා දී නැති බව | නිසිලෙස හා කාලීනව යාවත්කාලීන කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | උතුරු මැදපළාත් කාර්යාලය විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරිමේදී අවශ්‍ය තාක්ෂණික වාර්තා ලබා ගැනිමට කටයුතු නොකිරිම හා කර්මාන්තකරුවන්ගෙන් ඉල්ලුම් කර ඇති ජල තත්ත්ව වාර්තා ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු සිදුකර නොතිබුණි. | නිවැරදි කිරීම සඳහා නිලධාරින්ට උපදෙස් ලබා දී ඇති බව . | පසු විමරම් කටයුතු පිළිබඳ අවධානය යොමු කල යුතුය. |
| (ඈ) | වයඹ පළාත තුල ජාතික පාරිසරික පනත ක්‍රියාත්මක කිරීමේදී වයඹ පළාත් පරිසර පනත සමඟ ඇතිවන ගැටළුකාරී තත්ත්වය නිසා වයඹ පළාත් කාර්යාලයට අනුයුක්ත කර ඇති කාර්යමණ්ඩලය වයඹ පළාතේ බාහිර ආයතන සමඟ රාජකාරි කටයුතු කිරීමේදී ගැටළුකාරි තත්ත්වයන් ඇතිවී තිබුණි. | අවශ්‍ය ඉදිරි කටයුතු කිරීමට නියමිතය. | ජාතික පාරිසරික පනතට අනුව සියළුම පළාත් කටයුතු කල යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 20 කට වඩා පැරණි මෝටර් රථ 07 ක් අපහරණය කිරීම සඳහා කටයුතු කර නොතිබුණු අතර මුහුදු ජලයට හසු වීම හේතුවෙන් ධාවනයෙන් ඉවත් කර තිබූ මෝටර් රථයක් වර්ෂ 07 ක කාලයක් නිෂ්ක්‍රියව තිබුණි. | මුදල් රෙගුලාසි 104 පරික්ෂා පැවැත්වීමට කටයුතු කර ඇති බව. | කඩිනමින් අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.5 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇස්තමේන්තු ගත මුළු පිරිවැය එක්සත් ජනපද ඩොලර් 33,536,000ක් වූ ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදලේ කොරියානු ණය ආධාර මත ක්‍රියාත්මක ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ | ව්‍යාපෘති ඇගයීම් වාර්තාව සකස් කර කැබිනට් මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් | ණය ආධාර මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන බැවින් ව්‍යාපෘති කටයුතු කඩිනමින් ආරම්භ කිරීමට |

| | | |
|---|---|---|
| පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2015 ජූනි 29 දින අවසන් කිරීමට නියමිතව තිබුණද ,2020 මැයි වන විටත් ව්‍යාපෘතියේ සැලසුම් අදියරේ කටයුතු පමණක් අවසන් කර තිබුණි. එම නිසා ව්‍යාපෘති කාලසීමාව 2021 දක්වා දීර්ඝ කර තිබුණි. එසේම මෙම ව්‍යාපෘතිය ආරම්භකර වසර 5½ ක් ගතවී ඇතත් , බිම් පිරවුම් 04 හි ඉදි කිරීමේ කටයුතු මේ දක්වාම ආරම්භ කර නොතිබුණි. | කර ඇත. එම තීරණය අනුව ඉදිරි කටයුතු කළ යුතුව ඇත. | කටයුතු කළ යුතුය. |

**3.6 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නාගරික සංවර්ධන අධිකාරියට අයත් පර්චස් 109.88 ක ඉඩම් ප්‍රමාණයක් අනුමැතියකින් හා එකඟතාවයකින් තොරව අධිකාරිය විසින් භාවිතා කර තිබුණි. | ඉඩමේ අයිතිය පවරා ගැනීමට අදාල කටයුතු සිදුවෙමින් පවතී. | අනුමැතිය හා එකඟතාවය කඩිනමින් ලබා ගැනිමට කටයුතු කල යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 විගණන කමිටු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂිකව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්වුවද එම කමිටුවේදී ගන්නා ලද තීරණයන් ක්‍රියාත්මක කිරීම මන්දගාමී අයුරින් සිදුවී තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | විගණන කමිටුව විසින් ගන්නා ලද තීරණයක් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. |